# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2027/2 - 2017 ජූලි මස 10 වැනි සඳුදා - 2017.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

නිවේදනය

ද්විත්ව බදුකරණයෙන් සහන සැලසීම සඳහා ද, ආදායම් මත බදු නොගෙවා පැහැර හැරීම වැළැක්වීම සඳහා ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ පෝලන්ත ජනරජයේ ආණ්ඩුව අතර, 2015.10.06 වැනි දින එළඹි, මෙහි උපලේඛනයේ දක්වා ඇති ගිවිසුම 2016.01.27 වැනි දින සම්මත කර ගන්නා ලද යෝජනාව මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඇති බව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97 (1) (ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය, ආර්. එච්. එස්. සමරතුංග,<br>
ලේකම්,<br>
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2017 ජූලි මස 07 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව සහ පෝලන්ත ජනරජ ආණ්ඩුව ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මග හැරීම වැළැක්වීම සඳහා වූ ගිවිසුම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව සහ පෝලන්ත ජනරජ ආණ්ඩුව ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මග හැරීම වැළැක්වීම සඳහා වූ ගිවිසුමක් ඇති කර ගැනීමේ අභිලාෂයෙන් මතු දැක්වෙන පරිදි එකඟ වී ඇත.

*1 වැනි වගන්තිය*

*ආවරණය වන තැනැත්තන්*

ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් එකක හෝ දෙකෙහිම වාසිකයන් වන තැනැත්තන් කෙරෙහි මෙම ගිවිසුම අදාළ විය යුතු ය.

1A - G 25877 — 57 (2017/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*2 වැනි වගන්තිය*

*ආවරණය වන බදු*

1. ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි දේශපාලන උප කොට්ඨාශයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩල වෙනුවෙන් පනවනු ලබන ආදායම් මත වන බදුවලට, ඒවා අය කෙරෙන ආකාරය පිළිබඳව නොසලකා මෙම ගිවිසුම අදාළ විය යුතු ය.

2. චංචල හෝ නිශ්චල දේපළ අන්සතු කිරීමෙන් ලබන ලාභ මත වන බදු ඇතුළත්ව මුළු ආදායම මත හෝ ආදායමේ කොටසක් මත වන සියලුම බදු මෙන්ම ප්‍රාග්ධන අගය වැඩිවීම මත පනවනු ලබන බදු, ආදායම මත වන බදු වශයෙන් සැලකිය යුතු ය.

3. මෙම ගිවිසුමට අදාළ වන්නා වූ දැනට පවත්නා බදු වනුයේ:

(*අ*) පෝලන්තය සම්බන්ධයෙන්,
- පුද්ගල ආදායම් මත බද්ද, සහ
- සංස්ථාපිත ආදායම් බද්ද,

(මින් මතු ''පෝලන්ත බද්ද'' යනුවෙන් සඳහන් වේ);

(*ආ*) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්:
ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති ව්‍යවසායන්හි පිරිවැටුම මත පදනම් වූ බද්ද ඇතුළුව, ආදායම් බද්ද,

(මින්මතු ''ශ්‍රී ලංකා බද්ද'' යනුවෙන් සඳහන් වේ).

4. දැනට පවත්නා බදුවලට අතිරේකව හෝ ඒවා වෙනුවට මෙම ගිවිසුම අත්සන් කිරීමේ දිනයෙන් අනතුරුව පනවනු ලබන ඒ හා සමාන වූ හෝ බෙහෙවින් සමාන වූ වෙනත් යම් බදුවලට ද මෙම ගිවිසුම අදාළ විය යුතු වේ. ගිවිසුම්කාර රාජ්‍යයන් හි නිසි බලධාරීන් ඔවුන්ගේ බදුකරණ නීති සම්බන්ධයෙන් කරනු ලැබ ඇති ප්‍රධාන වෙනස්කම් පිළිබඳව එකිනෙකාට දැනුම් දියයුතු ය.

*3 වැනි වගන්තිය*

*පොදු අර්ථ නිරූපණ*

1. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා, පද සම්බන්ධය අනුව වෙනත් අයුරකින් තේරුම් ගතයුතු වුවහොත් මිස

(*අ*) ''පෝලන්තය'' යන පදයෙන් පෝලන්ත ජනරජය අදහස් වන අතර ඊට, භූගෝලීය වශයෙන් ගත්කළ පෝලන්ත නීති යටතේ සහ අන්තර්ජාතික නීතියට අනුකූලව මුහුදු පත්ලෙහි සහ එහි යටිපසෙහි ස්වභාවික සම්පත් ගවේෂණය කිරීම සහ ප්‍රයෝජනයට ගැනීමට අදාළව පෝලන්තය විසින් ස්වකීය හිමිකම් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි පෝලන්ත ජනරජයේ දේශසීමාව සහ පෝලන්ත ජන රජයේ සමුද්‍ර තීරයට යාබද යම් ප්‍රදේශයක් ද ඇතුළත් වේ;

(*ආ*) ''ශ්‍රී ලංකාව'' යන පදයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථ නිරූපනය කර ඇති පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත් දේශභූමිය අදහස් වන අතර ඊට, ජාත්‍යන්තර නීතියට හා ස්වකීය ජාතික ව්‍යවස්ථාවලට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් සිය ස්වෛරී අයිතිවාසිකම් සහ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන හෝ මින් මතුවට ක්‍රියාත්මක කරනු ලැබිය හැකි, එහි භූමි ප්‍රදේශය, අභ්‍යන්තර ජල ප්‍රදේශ සහ දේශසීමා මුහුදු ප්‍රදේශය හා ඊට ඉහළින් පිහිටි ගුවන් අවකාශය මෙන්ම අනන්‍ය ආර්ථික කලාපය සහ මහාද්වීපික තටාකය ද ඇතුළත් වේ;

(*ඇ*) ''ගිවිසුම්කාර රාජ්‍යය'' සහ ''අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය'' යන පදවලින් පද සම්බන්ධය අනුව අවශ්‍ය වන පරිදි පෝලන්තය සහ ශ්‍රී ලංකාව අදහස් කෙරේ;

(*ඈ*) ''තැනැත්තා'' යන පදයට යම් පුද්ගලයෙක්, සමාගමක්, සහ වෙනත් යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

(*ඉ*) ''සමාගම'' යන පදයෙන් සංස්ථාපිත මණ්ඩලයක් හෝ බදු කාර්යයන් සඳහා සංස්ථාපිත මණ්ඩලයක් ලෙස සලකනු ලබන යම් ආස්ථිතියක් අදහස් කෙරේ;

(*ඊ*) ''එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක්'' සහ ''අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක්'' යන පදවලින් පිළිවෙලින් එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායක් සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායක් අදහස් කෙරේ;

(*උ*) ''ජාතිකයා'' යන පදයෙන්;

(i) එකී ගිවිසුම්කාර රාජ්‍යයේ පුරවැසිභාවය හිමි යම් පුද්ගලයෙකු;

(ii) එකී ගිවිසුම්කාර රාජ්‍යයේ බලපැවැත්වෙන නීති මගින් ස්වකීය නෛතික තත්ත්වය ලබන යම් නෛතික තැනැත්තෙකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංගමයක්;

අදහස් කෙරේ.

(ඍ) ''ජාත්‍යන්තර ගමනාගමනය'' යන පදයෙන්, ගිවිසුම්කාර රාජ්‍යයක පිහිටි යම් ව්‍යවසායක් විසින් මෙහෙයවනු ලබන නැවක් හෝ ගුවන් යානයක් මගින්, එම නැව හෝ ගුවන් යානය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථානයන් අතර පමණක්ම ක්‍රියාත්මක කරන අවස්ථාවලදී හැර, කරනු ලබන ඕනෑම ප්‍රවාහනයක් අදහස් කෙරේ;

(එ) ''නිසි බලධාරියා'' යන පදයෙන්;

(i) පෝලන්තය සම්බන්ධයෙන්, මුදල් අමාත්‍ය හෝ එහි බලයලත් නියෝජිතයෙකු;

(ii) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු;

අදහස් කෙරේ.

2. ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් යම් අවස්ථාවක දී මෙම ගිවිසුම අදාළ කර ගැනීමේ දී එහි වෙනත් අයුරකින් අර්ථකථනය කොට නොමැති කිනම් හෝ පදයක්, පද සම්බන්ධය අනුව වෙනත් අයුරකින් තේරුම් ගැනීම අවශ්‍යවන්නේ නම් මිස, මෙම ගිවිසුමට අදාළ වන බදු කාර්යයන් සඳහා එම රාජ්‍යයේ නීති යටතේ එම අවස්ථාවේ දරන අර්ථයම දැරිය යුතු අතර, එම රාජ්‍යයේ බල පවත්නා බදු නීති යටතේ එම පදය දරන අර්ථය, එම රාජ්‍යයේ අනෙකුත් නීති යටතේ ඊට ඇති අර්ථය ඉක්මවා අදාළ විය යුතු ය.

### *4 වැනි වගන්තිය*

### *වාසිකයා*

1. මෙම ගිවිසුමෙහි කාර්යයන් සඳහා ''ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයා'' යන පදයෙන් එකී රාජ්‍යයේ නීති යටතේ යම් තැනැත්තෙකුගේ නිත්‍ය වාසය, වාසස්ථානය, කළමනාකරණ ස්ථානය, නීතිගත වූ හෝ ලියාපදිංචි ස්ථානය හෝ එවැනි සමාන ස්වභාවයක වෙනත් යම් නිර්ණායක හේතුවෙන් එම රාජ්‍යයෙහි බදු ගෙවීමට නියමිත යම් තැනැත්තෙකු අදහස් කෙරෙන අතර එයට එම රාජ්‍යය සහ එහි දේශපාලන උප කොට්ඨාසයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩල ද ඇතුළත් වේ. කෙසේ වුව ද, එම රාජ්‍යයේ ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම සම්බන්ධයෙන් පමණක්ම එම රාජ්‍යය තුළ දී බද්දට යටත් වන යම් තැනැත්තෙකු මෙම පදයට ඇතුළත් නොවේ.

2. 1 වන ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන යම් පුද්ගලයෙකු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම වාසිකයකු වන කල්හි, ඔහු පිළිබඳ තත්ත්වය පහත සඳහන් පරිදි තීරණය කළ යුතු යඃ

(අ) ඔහුට නිත්‍ය වාසස්ථානයක් තිබෙන රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහුට රාජ්‍යයන් දෙකෙහිම නිත්‍ය වාසස්ථානයක් තිබේ නම් ඔහු සමග වඩා සමීප පෞද්ගලික හා ආර්ථික සම්බන්ධතා තිබෙන (ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වන) රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වූ රාජ්‍යය නිගමනය කළ නොහැකි නම් හෝ එක් රාජ්‍යයක්වත් ඔහුට නිත්‍ය වාසස්ථානයක් නොතිබේ නම්, ඔහුට නිතර වාසය කරන වාසස්ථානයක් ඇති රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) ඔහු නිතර වාසය කරන වාසස්ථානයක් රාජ්‍යයන් දෙකෙහිම තිබේ නම් හෝ ඉන් එකකවත් එවැන්නක් නොතිබේ නම්, ඔහු තමා ජාතිකයෙකු වන රාජ්‍යයේ පමණක් වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) ඔහු රාජ්‍යයන් දෙකෙහිම ජාතිකයෙකු නම් හෝ ඉන් එකකවත් ජාතිකයෙකු නොවේ නම්, මෙම ප්‍රශ්නය ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් විසින් අන්‍යොන්‍ය එකඟත්වයකින් යුතුව නිරාකරණය කරගනු ලැබිය යුතු ය.

3. 1 වන ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන පුද්ගලයෙකු නොවන යම් තැනැත්තෙකු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම වාසිකයකු වන කල්හි, එම තැනැත්තා එහි ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටා ඇති රාජ්‍යයේ පමණක් වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතු ය. ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය පිහිටි රාජ්‍යය තීරණය කළ නොහැකි නම්, එවිට මෙම ප්‍රශ්නය ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධරයන් විසින් අන්‍යොන්‍ය එකඟත්වයකින් යුතු ව නිරාකරණය කරගනු ලැබිය යුතු ය.

*5 වැනි වගන්තිය*

*ස්ථිර ආයතනය*

1. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා ''ස්ථිර ආයතනය'' යන පදයෙන් ව්‍යවසායෙහි ව්‍යාපාරික කටයුතු මුළුමනින්ම හෝ ඉන් කොටසක් කරගෙන යනු ලබන ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් අදහස් කෙරේ.

2. ''ස්ථිර ආයතනය'' යන පදයට,

(අ) කළමනාකරණ ස්ථානයක්;
(ආ) ශාඛාවක්;
(ඇ) කාර්යාලයක්;
(ඈ) කර්මාන්ත ශාලාවක්;
(ඉ) වැඩපොළක්;
(ඊ) පතලක්, තෙල් හෝ ගෑස් ආකරයක්, ගල්වලක් හෝ ස්වාභාවික සම්පත් නිස්සාරණය කෙරෙන වෙනත් යම් ස්ථානයක්;

විශේෂයෙන් ඇතුළත් වේ.

3. ''ස්ථිර ආයතනය'' යන පදයට ඉහත අයුරින්මඃ

(අ) ඊට සම්බන්ධිත අධීක්ෂණ කටයුතු ද ඇතුළුව, ගොඩනැගිලි වැඩබිමක්, ඉදිකිරීමක්, එකලස් කිරීමේ හෝ සවි කිරීමේ ව්‍යාපෘතියක්, ස්වභාවික සම්පත් ගවේෂණය කිරීම හෝ සංවර්ධනය කිරීම සඳහා භාවිතා කරනු ලබන විදුම් වේදිකාවක් හෝ නැවක්, නමුත් එම වැඩබිම, ව්‍යාපෘතිය හෝ සම්බන්ධිත කටයුතු මාස 6 කට වැඩි කාලයක් පවතී නම් පමණක්;

(ආ) ව්‍යවසායක් විසින් එහි සේවකයන් හෝ වෙනත් සේවක පිරිස් යොදවා එමගින් උපදේශාත්මක සේවාවන්ද ඇතුළුව සේවාවන් සැපයීම, එහෙත් එබඳු ස්වභාවයේ කටයුතු (සමාන හෝ සම්බන්ධිත ව්‍යාපෘති සඳහා) ගිවිසුම්කාර රාජ්‍ය තුළ කිසියම් බදු අය කළහැකි වර්ෂය තුළ ආරම්භ වන හෝ අවසන් වන යම් දොළොස් මාසයක කාලපරිච්ඡේදයක් තුළ එකතුව දින 183 ක් ඉක්මවන කාලපරිච්ඡේදයක් හෝ කාලපරිච්ඡේදයන් සඳහා පවත්වාගෙන යන්නේ නම් පමණක්;

ඇතුළත් වේ.

4. මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ''ස්ථිර ආයතනය'' යන පදයට,

(අ) ව්‍යවසායට අයිති භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය, ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා පමණක් පහසුකම් පාවිච්චි කිරීම;

(ආ) ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා පමණක් ව්‍යවසායට අයත් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය, තොග පවත්වාගෙන යාම;

(ඇ) වෙනත් ව්‍යවසායක් විසින් සකස් කිරීමේ කාර්යය සඳහා පමණක් ව්‍යවසායට අයිති භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය තොග පවත්වාගෙන යාම;

(ඈ) ව්‍යවසාය සඳහා භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ හෝ තොරතුරු රැස්කිරීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම;

(ඉ) ව්‍යවසාය වෙනුවෙන් හුදෙක් ප්‍රාරම්භක හෝ සහායක ස්වරූපයක් ගන්නා වෙනත් යම් කටයුත්තක් කරගෙන යනු ලැබීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම;

(ඊ) උපඡේද (අ) සිට (ඉ) දක්වා සඳහන් කරන ලද කාර්යයන්ගේ ඕනෑම එකතුවක්, එහි සමස්ථ ප්‍රතිඵලය ප්‍රාරම්භක හෝ සහායක ස්වරූපයක් ගන්නේ නම් ඒ සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම;

ඇතුළත් නොවන ලෙස සැලකිය යුතු ය.

5. 7 වන ඡේදය අදාළ වන ස්වාධීන තත්ත්වයේ නියෝජිතයකු වන තැනැත්තෙකු හැර යම් තැනැත්තෙකු ගිවිසුම්කාර රාජ්‍යයක දී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් වෙනුවෙන් ක්‍රියා කරන අවස්ථාවක දී, එම තැනැත්තාඃ

(අ) සිය කටයුතු ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් මගින් ක්‍රියාත්මක කළේ වුවද එය ස්ථිර ආයතනයක් බවට පත් නොකරනු ලබන 4 වන ඡේදයේ සඳහන් කටයුතුවලට සීමා වන්නේ නම් මිස, එම රාජ්‍යයේ දී ව්‍යවසාය වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීමේ බලයක් ඇත්තා වූ සහ එම බලය සිරිතක් වශයෙන් ක්‍රියාත්මක කරන්නා වූ; හෝ

(ආ) එම තැනැත්තාට එවැනි බලයක් නොමැති නමුත්, පළමු සඳහන් රාජ්‍යයේ දී සිරිතක් වශයෙන් පවත්වාගෙන යන්නා වූ භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය තොගයක් මගින් ව්‍යවසාය වෙනුවෙන් නිරතුරුව භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය බෙදාහරින්නා වූ;

තැනැත්තෙකු වන්නේ නම්, 1 වැනි සහ 2 වැනි ඡේදයන් හි විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම තැනැත්තා ව්‍යවසාය වෙනුවෙන් සිදු කරනු ලබන යම් කටයුතු සම්බන්ධයෙන් එම ව්‍යවසායට පළමු සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්ථිර ආයතනයක් ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

6. ගිවිසුම්කාර රාජ්‍යයක රක්ෂණ ව්‍යවසායක්, 7 වන ඡේදය අදාල වන ස්වාධීන තත්ත්වයේ නියෝජිතයෙකු වන්නා වූ තැනැත්තෙකු නොවන වෙනත් තැනැත්තෙකු මගින් අනෙක් රාජ්‍යයේ භූමි ප්‍රදේශය තුළ වාරික එකතු කිරීම සිදු කරන්නේ නම් හෝ එම භූමි ප්‍රදේශය තුළ පවතින යම් අවදානම් රක්ෂණය කරනු ලබන්නේ නම්, මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ප්‍රතිරක්ෂණ සම්බන්ධයෙන් හැර, එයට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථිර ආයතනයක් තිබේ යයි සලකනු ලැබිය යුතු ය.

7. ස්වකීය සාමාන්‍ය ක්‍රියාපරිපාටිය අනුව ක්‍රියා කරන තැරැව්කරුවකු, සාමාන්‍ය කොමිස් නියෝජිතයෙකු හෝ ස්වාධීන තත්ත්වයක් දරන වෙනත් යම් නියෝජිතයෙකු මගින් යම් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් රාජ්‍යයේ ව්‍යාපාර කටයුතු කරගෙන යන හේතුව නිසාවෙන්ම එයට එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථිර ආයතනයක් තිබේ යයි නොසැලකිය යුතු ය. කෙසේ වුව ද, එවැනි නියෝජිතයෙකුගේ කටයුතු එම ව්‍යවසාය වෙනුවෙන් සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් කැපකොට ඇති විටෙක, සහ එම ව්‍යවසාය සහ නියෝජිතයා අතර වාණිජ්‍ය සහ මූල්‍ය සම්බන්ධතා ස්වාධීන ව්‍යවසායන් අතර ඇති කරගත හැකිව තිබූ ආකාරයට වඩා වෙනස් ලෙස කොන්දේසි ඇති කරගෙන හෝ පනවා ඇති විටක මෙම ඡේදයේ අර්ථානුකූලව ඔහු නිදහස් තත්ත්වයක් දරන නියෝජිතයෙකු ලෙස සලකනු නොලැබිය යුතු ය.

8. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික සමාගමක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික වන සමාගමක් පාලනය කිරීම හෝ එවැනි සමාගමක් විසින් පාලනය කරනු ලැබීම හෝ (ස්ථිර ආයතනයක් මගින් හෝ වෙනත් යම් ආකාරයට) අනෙක් රාජ්‍යයේ ව්‍යාපාරයන් කරගෙන යාම යන හේතුවෙන්ම, එක් සමාගමක් අනෙකෙහි ස්ථිර ආයතනයක් නොවිය යුතු ය.

## *6 වැනි වගන්තිය*

## *නිශ්චල දේපළවලින් ලැබෙන ආදායම*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි (කෘෂිකර්මයෙන් හෝ වන වගාවෙන් ලබන ආදායම ද ඇතුළුව) නිශ්චල දේපළවලින් ලබන ආදායම එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

2. ''නිශ්චල දේපළ'' යන පාඨය, ප්‍රශ්නයට තුඩු දී ඇති දේපළ පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේ නීතිය යටතේ එම පාඨය දරන අර්ථයම දැරිය යුතු ය. කුමන අවස්ථාවක දී වුව ද, මෙම පාඨයට නිශ්චල දේපළවලට අනුබද්ධ වන දේපළ, පශු සම්පත් සහ කෘෂිකර්මයෙහි දී සහ වන වගාවේ දී පාවිච්චි කරන උපකරණ, ඉඩකඩම් දේපළ සම්බන්ධ සාමාන්‍ය නීතියේ විධිවිධාන අදාළ වන අයිතිවාසිකම්, නිශ්චල දේපළවල භුක්තිය සහ ඛනිජ නිධි, ප්‍රභවයන් සහ වෙනත් ස්වභාවික සම්පත්වල වැඩ කිරීම හෝ වැඩ කිරීමේ අයිතිවාසිකම් සඳහා ප්‍රතිෂ්ඨා වශයෙන් විචල්‍ය හෝ ස්ථිර ගෙවීම් ලැබීමේ අයිතිවාසිකම් යන මේවා ඇතුළත් විය යුතු ය; නැව්, බෝට්ටු සහ ගුවන් යානා නිශ්චල දේපළ ලෙස සලකනු නොලැබිය යුතු ය.

3. 1 වැනි ඡේදයේ විධිවිධාන, නිශ්චල දේපළ කෙළින්ම ප්‍රයෝජනයට ගැනීමෙන්, කුළියට දීමෙන් හෝ වෙනයම් ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීමෙන් ලබන ආදායම සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

4. 1 වැනි සහ 3 වැනි ඡේදවල විධිවිධාන, යම් ව්‍යවසායක නිශ්චල දේපළවලින් ලැබෙන ආදායමට සහ ස්වාධීන පෞද්ගලික සේවා ඉටු කිරීම සඳහා යොදා ගන්නා නිශ්චල දේපළවලින් ලැබෙන ආදායමට ද අදාළ විය යුතු ය.

*7 වැනි වගන්තිය*

*ව්‍යාපාර ලාභ*

1. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නේ නම් මිස, එම ව්‍යවසායෙහි ලාභ බද්දට යටත් කළ හැකි වන්නේ එකී ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී පමණකි. ව්‍යවසාය ඉහත කී පරිදි ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යන්නේ නම් එහි ලාභ අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළහැකි නමුත්, එසේ බද්දට යටත් කළ හැක්කේ එම ස්ථිර ආයතනයට ආරෝපණය කළහැකි ප්‍රමාණයට පමණි.

2. 3 වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායයක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්වකීය ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවක දී එම ස්ථිර ආයතනය, එය ස්ථිර ආයතනයක් වන්නේ කවර ව්‍යවසායක ද එම ව්‍යවසාය සමග එම තත්ත්වයන් හෝ සමාන තත්ත්වයන් යටතේ, එම කටයුතුවලම හෝ ඒ හා සමාන කටයුතුවල සම්පූර්ණයෙන්ම, ස්වාධීනව නිරත වෙනස් හා වෙන් වූ ව්‍යවසායක් වූයේ නම් ඊට ලැබෙතැයි අපේක්ෂා කළ හැකි ලාභ, එම ස්ථිර ආයතනයට ලැබුණු ලෙස එක් එක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී සලකනු ලැබිය යුතු ය.

3. ස්ථිර ආයතනයක ලාභ තීරණය කිරීමේ දී විධායක සහ පොදු පරිපාලන වියදම් ද ඇතුළුව එම ස්ථිර ආයතනයේ ව්‍යාපාරික කාර්යයන් සඳහා දරන ලද වියදම් එම ස්ථිර ආයතනය පිහිටි රාජ්‍යයෙහි හෝ වෙනත් ස්ථානයක දී හෝ දරනු ලැබුවේ වුව ද, ඒවා අඩු කිරීම් ලෙස ඉඩ දිය යුතු ය.

4. ව්‍යාපාරයේ මුළු ලාභය, එහි විවිධ කොටස්වලට විභජනය කිරීමේ ක්‍රමය පදනම් කොටගෙන ස්ථිර ආයතනයකට ආරෝපණය කළයුතු ලාභ නිර්ණය කිරීම ගිවිසුම්කාර රාජ්‍යයක සිරිතක්ව පවතිනතාක් කල් මෙම වගන්තියේ 2 ඡේදයෙහි ඇති කිසිවකින් එම ගිවිසුම්කාර රාජ්‍යය එසේ සිරිතක් ලෙස කළහැකි විභජනය මගින් බදු අයකළ හැකි ලාභ නිර්ණය කිරීමෙන් නොවැළැක්විය යුතු ය. කෙසේ වුවද, අනුගමනය කරන විභජනය කිරීමේ ක්‍රමයෙන් ලබන ප්‍රතිඵලය මෙම වගන්තියේ ඇතුළත් මූලධර්මයන්ට අනුකූල වියයුතු ය.

5. යම් ස්ථිර ආයතනයක් විසින් ව්‍යවසාය සඳහා කරනු ලබන භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය වල හුදු මිලයට ගැනීම පමණක්ම හේතුවෙන් එකී ස්ථිර ආයතනයට යම් ලාභයක් ආරෝපණය නොකළ යුතු ය.

6. ඉහත කී ඡේදයන්හි කාර්යයන් සඳහා, එසේ නොකිරීමට යෝග්‍ය හා ප්‍රමාණවත් හේතු ඇත්තේ නම් මිස, වර්ෂයෙන් වර්ෂයට එකම ක්‍රමය මගින් ස්ථිර ආයතනයකට ආරෝපණය කළයුතු ලාභය තීරණය කළ යුතු ය.

7. මෙම ගිවිසුමෙහි අනෙකුත් වගන්තිවල වෙනම සඳහන් කරනු ලැබ ඇති ආදායම් අයිතමයන් ලාභවලට ඇතුළත් වන අවස්ථාවක දී, එකී වගන්තිවල විධිවිධානයන්ට මෙම වගන්තියේ විධිවිධාන මගින් බල පෑමක් ඇති නොවිය යුතු ය.

*8 වැනි වගන්තිය*

*නාවික සහ ගුවන් ප්‍රවාහනය*

1. ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා නැව් හෝ ගුවන් යානා මෙහෙයුම් කිරීමෙන් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් උපයනු ලබන ලාභ එම ව්‍යවසාය වාසික වන්නා වූ රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතු ය.

2. 1 වැනි වගන්තියෙහි විධිවිධානයන්හි කුමක් සඳහන් වුව ද, එක් ගිවිසුම්කාර රාජ්‍යයකදී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් විසින් ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා නැව් මෙහෙයුම් කිරීමෙන් ලබන ලාභ වලින් පළමු කී රාජ්‍යයේ දී බදු අය කළ හැකි නමුත් එසේ අයකරනු ලබන බද්ද එයින් සියයට 50 කට සමාන ප්‍රමාණයකින් අඩු කළ යුතු ය.

3. සංචිතයකට, බද්ධ ව්‍යාපාරයකට හෝ ජාත්‍යන්තර මෙහෙයුම් නියෝජිතායතනයකට සහභාගි වීමෙන් ලැබෙන ලාභවලට ද 1 වන 2 වන ඡේදවල විධිවිධාන අදාළ වියයුතු නමුත්, එසේ අදාළ වියයුතු වන්නේ බද්ධ ව්‍යාපාරයෙහි සහභාගීවන්නාට ස්වකීය කොටසට ආරෝපණය කළහැකි එසේ උපයනු ලබන ලාභ ප්‍රමාණයට පමණි.

*9 වැනි වගන්තිය*

*සම්බන්ධිත ව්‍යවසායයන්*

1. (*අ*) ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමණාකරණය, පාලනය හෝ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් ඍජුව හෝ වක්‍ර ලෙස සහභාගි වන, හෝ

(*ආ*) එකම තැනැත්තන් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමණාකරණයට, පාලනයට හෝ ප්‍රාග්ධනයට ඍජුව හෝ වක්‍ර ලෙස සහභාගි වන අවස්ථාවක,

සහ ඒ අවස්ථා දෙකින් කවර අවස්ථාවකදී වුවද, ස්වාධීන ව්‍යවසායයන් අතර පවත්නා වාණිජ්‍ය හා මූල්‍ය සම්බන්ධතා පිළිබඳ කොන්දේසිවලට වෙනස් කොන්දේසි ඒ ව්‍යවසායන් දෙක අතර ඇති කරගෙන හෝ පනවා ඇති කල්හි, ඒ කොන්දේසි නොතිබුණි නම්, ඒ ව්‍යවසායයන්ගෙන් එකකට උපචිත වියහැකි වූ නමුත්, ඒ කොන්දේසි නිසා එසේ උපචිත නොවූ කවර ලාභ වුව ද, ගිවිසුම්කාර රාජ්‍ය විසින් ඒ ව්‍යවසායේ ලාභවලට ඇතුළත් කර, ඒ අනුව ලාභ මත බදු අය කළ හැකි ය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක් එහි ව්‍යවසායක ලාභයෙහි ඇතුළත් කරනු ලබන සහ ඒ අනුව බදු කරනු ලබන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක එකී රාජ්‍යයේ බද්දට යටත් කරනු ලැබ ඇති ලාභය, ව්‍යවසායන් දෙක අතර ඇති කරගත් කොන්දේසි ස්වාධීන ව්‍යවසායන් අතර ඇති කරගත හැකිව තිබූ කොන්දේසිම වූ විටක පළමුව සඳහන් කරන ලද රාජ්‍යයේ ව්‍යවසායට උපචිත විය යුතු වූ විට, එම ලාභය මත අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පනවනු ලැබූ බදු ප්‍රමාණයට යෝග්‍ය ගැලපුමක් එම අනෙක් රාජ්‍යය විසින් සිදු කරනු ලැබිය යුතු ය. එවැනි ගැලපුමක් තීරණය කිරීමේ දී මෙම ගිවිසුමේ අනෙකුත් විධිවිධාන කෙරෙහි ද නිසි අවධානය යොමු කළයුතු අතර, අවශ්‍යවන්නේ නම්, ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධාරීන් එකිනෙකා විමසිය යුතු වන්නේ ය.

3. අධිකරණමය, පරිපාලනමය හෝ වෙනත් නෛතික ක්‍රියාමාර්ගයන් මගින් අවසන් වශයෙන් තීරණය වී ඇත්තේ 1 වන ඡේදය යටතේ ලාභ ගැලපීමක් පැන නැගීමට හේතු කාරවූ ක්‍රියාමාර්ග අදාළ ව්‍යවසායන්ගෙන් එකක ඉතා නොසැලකිල්ල හෝ හිතාමතාම පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනයට යටත්වීම නම්, 2 වැනි ඡේදයේ සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු ය.

*10 වැනි වගන්තිය*

*ලාභාංශ*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන ලාභාංශ එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. කෙසේ වුව ද, ලාභාංශ ගෙවන සමාගම වාසිකයෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී ද එම රාජ්‍යයේ නීතිවලට අනුකූලව එවැනි ලාභාංශවලින් බදු අය කළ හැකි නමුත්, ලාභාංශවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එසේ අය කරන බද්ද දළ ලාභාංශ ප්‍රමාණයෙන් සියයට 10 නොඉක්ම විය යුතු ය.

ලාභාංශ ගෙවනු ලබන්නේ කුමන ලාභ වලින්ද, එම ලාභ සම්බන්ධයෙන් සමාගමෙන් බදු අය කිරීම කෙරෙහි මෙම ඡේදයේ විධිවිධාන බල නොපෑ යුතු ය.

3. මෙම වගන්තියෙහි යොදා ගනු ලැබ ඇති පරිදි "ලාභාංශ" යන පදයෙන් කොටස් වලින් ලබන ආදායම, හෝ ණය හිමිකම් නොවන්නාවූ, ලාභයට සහභාගිවන, වෙනත් අයිතිවාසිකම් වලින් ලබන ආදායම; මෙන්ම බෙදාහැරීම කරනු ලබන සමාගම වාසික වන රාජ්‍යයේ නීති මගින් කොටස් වලින් ලබන ආදායම බදු කරණයට භාජනය කරනු ලබන ආකාරයටම බදු කරණයට භාජනය වන්නා වූ වෙනත් සංස්ථාපිත අයිතිවාසිකම්වලින් ලබන්නාවූ ආදායම ද අදහස් කෙරේ.

4. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන්නා වූ, ලාභාංශවල අර්ථලාභී හිමිකරු, ලාභාංශ ගෙවන සමාගම වාසික වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී එහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාර කටයුතු කරගෙන යන්නේනම් හෝ එහි පිහිටි ස්ථාවර පදනමක් මගින් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී ස්වාධීන පුද්ගල සේවා ඉටු කරන්නේ නම් සහ ලාභාංශ ගෙවනු ලබන කොටස් දරන සමාගම එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමඟ ඵලදායී ලෙස සම්බන්ධව පවතී නම්, 1 වැනි හා 2 වැනි ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතු ය. එවැනි අවස්ථාවන්හි දී අවස්ථාවෝචිත පරිදි 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

5. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙන් ලාභ හෝ ආදායම් උපයන අවස්ථාවකදී එම සමාගම විසින් ගෙවනු ලබන ලාභාංශ, එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනතාක් දුරට හෝ ලාභාංශ ගෙවනු ලබන කොටස් දැරීමක් එම අනෙක් රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයකට හෝ ස්ථාවර පදනමකට ඵලදායී ලෙස සම්බන්ධ වී ඇතිතාක් දුරට හැර,

සමාගම විසින් ගෙවනු ලබන ලාභාංශ සම්බන්ධයෙන් බදු කිසිවක් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍ය විසින් නොපනවා සිටිය හැකිවාක් මෙන්ම, ගෙවන ලද ලාභාංශ හෝ නොබෙදූ ලාභ එම අනෙක් රාජ්‍යයෙන් පැන නගින ලාභ හෝ ආදායම් වලින් මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් සමන්විත වන්නේ වුවද, සමාගමේ නොබෙදූ ලාභ, සමාගමේ නොබෙදූ ලාභ මත වන බද්දකට භාජනය නොකර සිටිය හැකිය.

*11 වැනි වගන්තිය*

*පොළිය*

1. ගිවිසුම්කාර රාජ්‍යයකදී උද්ගත වන පොළිය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන විටකදී එම පොළිය එකී අනෙක් රාජ්‍යයේදී බද්දට යටත් කළ හැකි ය.

2. කෙසේ වුව ද, එම පොළියෙන් එය උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී ද, එම රාජ්‍යයේ නීතිය අනුව, බදු අය කළහැකි නමුත් පොළියේ අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වේ නම්, එසේ අයකරනු ලබන බද්ද දළ පොළී ප්‍රමාණයෙන් සියයට 10 ක් නොඉක්ම විය යුතු ය.

3. 2 වන ඡේදයේ විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක දී උද්ගත වන්නා වූ සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ප්‍රාදේශීය බල මණ්ඩලයක්, මහ බැංකුව හෝ ආණ්ඩුව විසින් පාලනය කරනු ලබන යම් මූල්‍යායතනයක් ඇතුලුව එම ගිවිසුම්කාර රාජ්‍යයේ ආණ්ඩුව වෙත ගෙවනු ලබන්නා වූ පොළිය පළමුව සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් වියයුතු ය.

4. 3 වන ඡේදයේ කාර්යයන් සඳහා ''මහ බැංකුව හෝ ආණ්ඩුව විසින් පාලනය කරනු ලබන යම් මූල්‍යායතනයක්'' යන පදයට:

(අ) පෝලන්තය සම්බන්ධයෙන්;
- (i) පෝලන්ත ජාතික බැංකුව,
- (ii) ප්‍රාග්ධනය පූර්ණ වශයෙන්ම පෝලන්ත ආණ්ඩුව සතු වෙනත් යම් මූල්‍යායතනයක්,

(ආ) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්;
- (i) ශ්‍රී ලංකා මහ බැංකුව,
- (ii) ප්‍රාග්ධනය පූර්ණ වශයෙන්ම ශ්‍රී ලංකා ආණ්ඩුව සතු වෙනත් යම් මූල්‍යායතනයක්,

අදහස් වේ.

5. මෙම වගන්තියේ යෙදී තිබෙන ''පොළිය'' යන පදයෙන්, උකසක් මගින් ඇප තබා ඇති හෝ නැති, සහ ණයගැතියාගේ ලාභවලට සහභාගීවීමේ අයිතිවාසිකම් සහිත හෝ රහිත, සියලු වර්ගයන්හි ණය හිමිකම්වලින් ලැබෙන ආදායම සහ විශේෂයෙන් රජයේ සුරැකුම්පත් සහ බැඳුම්කර හෝ සෘණ පත්‍රවලින් ලැබෙන, එවැනි සුරැකුම්පත්වලට, බැඳුම්කරවලට හෝ සෘණ පත්‍රවලට බැඳී ඇති අධි මිල සහ ත්‍යාග ඇතුළත්, ආදායම අදහස් වේ. මෙම වගන්තියේ කාර්යයන් සඳහා ප්‍රමාද ගෙවීම වෙනුවෙන් අය කරන දණ්ඩන ගාස්තු පොළිය ලෙස සලකනු නොලැබිය යුතු ය.

6. එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන්නාවූ පොළී ආදායමෙහි අර්ථලාභී හිමිකරු පොළිය උද්ගත වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මඟින් ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යන්නේ නම් හෝ එකී අනෙක් රාජ්‍යයෙහි පිහිටා ඇති ස්ථාවර පදනමක් මඟින් ස්වාධීන පෞද්ගලික සේවා ඉටු කරනු ලබන්නේ නම් සහ පොළිය ගෙවනු ලබන ණය හිමිකම, එකී ස්ථිර ආයතනය සමග හෝ ස්ථාවර පදනම සමඟ හෝ ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇත්නම්, 1 වැනි සහ 2 වැනි ඡේදයන්හි විධිවිධාන අදාළ නොවිය යුතුය. එවැනි විටකදී අවස්ථාවෝචිත පරිදි මෙම ගිවිසුමෙහි 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අදාළ වියයුතු ය.

7. පොළිය ගෙවන්නා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන කල්හි පොළිය එම ගිවිසුම්කාර රාජ්‍යයේ දී උද්ගත වන ලෙස සැලකිය යුතු ය. කෙසේ වෙතත්, එම පොළිය ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වුව ද, නොවුව ද, ඔහුට පොළිය ගෙවීමට උපචිත වූ ණයගැතිභාවය හා සම්බන්ධ වූ ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක තිබෙන අවස්ථාවක දී සහ එම පොළිය දරනු ලබන්නේ එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම විසින් නම්, එවිට ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම තිබෙන ගිවිසුම්කාර රාජ්‍යයේ දී එම පොළිය උද්ගත වන ලෙස සැලකිය යුතු ය.

8. ගෙවන්නා සහ අර්ථලාභී හිමිකරු අතර හෝ ඔවුන් දෙදෙනා සහ වෙනත් යම් තැනැත්තෙකු අතර විශේෂ සම්බන්ධතාවයක් පැවතීම හේතුවෙන් ණය හිමිකම් සම්බන්ධයෙන් ගෙවනු ලබන පොළී ප්‍රමාණය, එවැනි සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී

ගෙවන්නා සහ අර්ථලාභී හිමිකම් ඇති තැනැත්තා විසින් එකඟ විය හැකි ව තිබුණු ප්‍රමාණය ඉක්මවන්නේ නම්, මෙම වගන්තියේ විධිවිධාන බල පැවැත්විය යුත්තේ පසුව සඳහන් කළ ප්‍රමාණයට පමණි. එවැනි අවස්ථාවක ගෙවීම්වල අතිරික්ත කොටස, මෙම ගිවිසුමෙහි අනෙක් විධිවිධාන සුදුසු පරිදි සැලකිල්ලට ගනිමින්, ඒ ඒ ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුව තවදුරටත් බදුවලට යටත් කළයුතු ය.

*12 වැනි වගන්තිය*

*රාජ්‍යභාග සහ තාක්ෂණික සේවා සඳහා ගාස්තු*

1. ගිවිසුම්කාර රාජ්‍යයක උද්ගත වන සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වෙත ගෙවන රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු ඒ අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළහැකිය.

2. කෙසේ වුව ද, එම රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු, ඒවා උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයේදී ද එම ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුව බද්දට යටත් කළහැකි වේ. එහෙත් රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තුවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එසේ අය කෙරෙන බද්ද එම රාජ්‍යභාගවල හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තුවල දළ ප්‍රමාණයෙන් සියයට 10 නො ඉක්මවිය යුතුය.

3. (අ) මෙම වගන්තියේ යොදා ඇති පරිදි ''රාජ්‍යභාග'' යන පදයෙන් කිසියම් ප්‍රකාශන අයිතියක්, පේටන්ට් බලපත්‍රයක්, වෙළඳ ලකුණක්, මෝස්තරයක් හෝ ආදර්ශකයක්, පිඹුරක්, රහස්‍ය වට්ටෝරුවක් හෝ ක්‍රියාවලියක් භාවිතා කිරීම සඳහා හෝ භාවිතා කිරීමට අයිතිය ලබාගැනීම සඳහා වූද, හෝ කිසියම් කාර්මික, වාණිජ්‍යමය හෝ විද්‍යාත්මක උපකරණ භාවිත කිරීමට හෝ භාවිතා කිරීමේ අයිතිය ලබා ගැනීම සඳහා වූද, හෝ විද්‍යාත්මක, වාණිජ්‍යමය හෝ කාර්මික අත්දැකීම් පිළිබඳ තොරතුරු සඳහා, ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ලැබුණු ඕනෑම වර්ගයක ගෙවීමක් අදහස් කෙරේ.

(ආ) මෙම වගන්තියෙහි යොදා ගනු ලැබ ඇති පරිදි ''තාක්ෂණික සේවා සඳහා ගාස්තු'' යන පදයෙන් කළමනාකරණ හෝ තාක්ෂණික හෝ උපදේශන සේවා ලබාදීම වෙනුවෙන් ප්‍රතිෂ්ඨාවක් වශයෙන් වන, 15 වැනි වගන්තියෙහි සඳහන් ගෙවීම් නොවන, ඕනෑම වර්ගයක ගෙවීම් අදහස් කෙරේ.

4. එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු වන්නාවූ රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු වල අර්ථලාභී හිමිකරු එම රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු උද්ගත වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී, එහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නේ නම් හෝ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍ය තුළ පිහිටි ස්ථාවර පදනමක් මගින් ස්වාධීන පුද්ගලික සේවා ඉටු කරන්නේ නම් සහ රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු ගෙවනු ලබන අයිතිවාසිකම් හෝ දේපළ එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමඟ හෝ ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇත්නම්, මෙම වගන්තියේ 1 වැනි සහ 2 වැනි ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එවැනි අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අදාළ වියයුතු ය.

5. රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු, ගෙවන්නා වාසිකයෙකු වන රාජ්‍යයේම උද්ගත වන්නේ යැයි සැලකිය යුතු ය. එසේ වුව ද, රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වුව ද, නොවුව ද, රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු ගෙවීමේ වගකීම හා බැඳුනු ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක ඔහු සතුව තිබේ නම් සහ එම රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම මගින් දරනු ලබන්නේ නම්, එවැනි අවස්ථාවක එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම පිහිටි රාජ්‍යයේ දී එම රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු උද්ගතවන ලෙස සැලකිය යුතු ය.

6. ගෙවන්නා සහ අර්ථලාභී හිමිකරු අතර හෝ ඔවුන් දෙදෙනාම සහ වෙනත් යම් තැනැත්තෙකු අතර පවත්නා විශේෂ සම්බන්ධතාවයක් නිසා, ගෙවීම් කරනු ලබන භාවිතය, අයිතිවාසිකම හෝ තොරතුරු සැලකිල්ලට ගත්කළ, ගෙවනු ලබන රාජ්‍යභාග හෝ තාක්ෂණික සේවා සඳහා ගාස්තු ප්‍රමාණය, එවැනි සම්බන්ධතාවයක් නොමැති විට ගෙවන්නා සහ ලබන්නා විසින් එකඟ විය හැකිව තිබුණු ප්‍රමාණය ඉක්මවන විට, මෙම වගන්තියේ විධිවිධාන අදාළ වියයුත්තේ අවසානයට සඳහන් ප්‍රමාණයට පමණි. එවැනි අවස්ථාවක මෙම ගිවිසුමෙහි අනෙක් විධිවිධානයන් කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින්, ගෙවීම්වල අතිරික්තය එක් එක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුකූලව තවදුරටත් බද්දට යටත් වියයුතු ය.

*13 වැනි වගන්තිය*

*ප්‍රාග්ධන ලාභ*

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින්, 6 වැනි වගන්තියෙහි සඳහන් කර ඇත්තාවූද අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටියාවූද නිශ්චල දේපල අන්සතු කිරීමෙන් ලබන ලාභ, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායකට අයත් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි තිබෙන ස්ථිර ආයතනයක ව්‍යාපාර දේපළවලින් කොටසක් වන චංචල දේපළ අන්සතු කිරීමෙන් හෝ ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි තිබෙන ස්ථාවර පදනමකට අදාළව ස්වාධීන පුද්ගලික සේවා සැපයීම සඳහා වන චංචල දේපළ අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ, එම ස්ථිර ආයතනය (එය පමණක් හෝ සම්පූර්ණ ව්‍යවසාය සමග) හෝ එකී ස්ථාවර පදනම අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ ද ඇතුළුව, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි ය.

3. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙක් විසින් අන්තර්ජාතික ගමනාගමනයෙහි යොදවන ලද නැව් හෝ ගුවන්යානා හෝ එවැනි නැව් හෝ ගුවන්යානා මෙහෙයවීමට අදාළ චංචල දේපළ අන්සතු කිරීමෙන් ලබන ලාභ, එකී රාජ්‍යයන්හි දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

4. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙක් විසින් සමාගමක කොටස් අන්සතු කිරීමෙන් සෘජුවම හෝ වක්‍රව ලබන ලාභ, එකී සමාගමේ වටිනාකමින් සියයට 50 කට වඩා හටගන්නේ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි නිශ්චල දේපළ මගින් නම්, එකී ලාභ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

5. 4 වැනි ඡේදය අදාළ වන්නා වූ කරුණු හැර, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික සමාගමක කොටස් අන්සතු කිරීමෙන් උපයනු ලබන ලාභ, එම සමාගමේ ප්‍රාග්ධනයෙන් අවම වශයෙන් සියයට 50ක් එසේ අන්සතු කිරීමට පෙරාතුවම වූ මාස දොළහක කාලය තුල කිසියම් විට සෘජුව හෝ වක්‍රව අන්සතු කරන්නා දැරුවේ නම්, එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කරනු ලැබිය හැකි ය.

6. 1, 2, 3, 4, හා 5 වන ඡේදවල සඳහන් දේපළක් හැර, යම් දේපළක් අන්සතු කිරීමෙන් ලැබෙන ලාභ, ඒවා අන්සතු කරන්නා වාසිකයෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළයුතු ය.

*14 වැනි වගන්තිය*

***ස්වාධීන පෞද්ගලික සේවා***

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික පුද්ගලයෙකු විසින් වෘත්තීය සේවා හෝ සමාන ස්වභාවයේ වෙනත් ස්වාධීන ක්‍රියාකාරකම් ඉටු කිරීම වෙනුවෙන් ලබන ආදායම, එම ආදායම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී ද බද්දට යටත් කළ හැකි පහත සඳහන් අවස්ථාවල දී හැර, එම රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

(අ) ඔහුට තම කටයුතු ඉටු කිරීම සඳහා අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නිරන්තරව ම ස්ථාවර පදනමක් ඇති කල්හි, එම ස්ථාවර පදනමට ආරෝපණය කළහැකි ආදායම පමණක් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළහැකි ය; හෝ

(ආ) ඔහු, අදාළ පරිදි බදු අය කළ හැකි වර්ෂයක් තුළ ආරම්භ වන හෝ අවසන් වන මාස 12 ක කාලපරිච්ඡේදයක් තුළ දී එකතුව දින 183 ක් ඉක්මවන කාලපරිච්ඡේදයක් හෝ කාලපරිච්ඡේදයන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ගත කරයි නම්, එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී ඔහු ඉටු කරනු ලබන කටයුතුවලින් ලබන ආදායම පමණක් එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළහැකි ය.

2. ''වෘත්තීය සේවා'' යන පදයට විශේෂයෙන් ස්වාධීන විද්‍යාත්මක, සාහිත්‍යමය, කලාත්මක, අධ්‍යාපනික හෝ ඉගැන්වීමේ ක්‍රියාකාරකම් මෙන්ම වෛද්‍යවරුන්ගේ, නීතිඥයින්ගේ, ඉංජිනේරුවරුන්ගේ, ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ, දන්ත වෛද්‍යවරුන්ගේ සහ ගණකාධිකාරිවරුන්ගේ ස්වාධීන ක්‍රියාකාරකම් ද ඇතුළත් වේ.

*15 වැනි වගන්තිය*

***පරායත්ත පෞද්ගලික සේවා***

1. 16, 18 හා 19 වන වගන්තිවල විධිවිධානයන් ට යටත් ව, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු සේවා නියුක්තියකින් ලබන වැටුප්, වේතන සහ එවැනි වෙනත් පාරිශ්‍රමිකයන්, එකී සේවා නියුක්තියෙහි යෙදෙන්නේ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි නොවන්නේ නම්, එකී රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් විය යුතු ය. එසේ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී සේවා නියුක්තියෙහි යෙදෙන්නේ නම්, එම සේවා නියුක්තියෙන් එසේ ලබන පාරිශ්‍රමික එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී බද්දට යටත් කළහැකි ය.

2. 1 වැනි ඡේදයේ විධිවිධානයන් හි කුමක් සඳහන් වුව ද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙ හි යෙදෙන සේවා නියුක්තියකින් ලබන පාරිශ්‍රමිකයඃ

(අ) එම පාරිශ්‍රමිකය ලබන්නා, අදාළ බදු අය කළ හැකි වර්ෂයක් තුළ ආරම්භවන හෝ අවසන් වන යම් දොළොස් මාසයක කාලපරිච්ඡෙදයක් තුළ එකතුව දින 183 කට නොවැඩි කාලපරිච්ඡේදයක් හෝ කාලපරිච්ඡේදයන් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි සිටින්නේ නම්, සහ

(ආ) එම පාරිශ්‍රමිකය, එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු නොවන සේවා යෝජකයෙකු විසින් හෝ වෙනුවෙන් ගෙවනු ලබන්නේ නම්, සහ

(ඇ) එම පාරිශ්‍රමිකය, සේවා යෝජකයාට එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ඇති ස්ථිර ආයතනයකින් හෝ ස්ථාවර පදනමකින් දරනු නොලබන්නේ නම්,

එකී පළමුව සඳහන් කළ රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතු ය.

3. මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන් හී කුමක් සඳහන් වුව ද, ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා මෙහෙයවනු ලබන නැවක හෝ ගුවන් යානයක කරනු ලබන සේවා නියුක්තියක් සම්බන්ධයෙන් ලබන පාරිශ්‍රමිකය, එම ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී බද්දට යටත් කළහැකි ය.

*16 වැනි වගන්තිය*

*අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු*

ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික වන සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්, අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් හෝ සමාගමේ ඊට සමාන වෙනත් යම් මණ්ඩලයක සාමාජිකයෙකු වශයෙන් ලබන ගාස්තු හා වෙනත් සමාන ගෙවීම්, එම අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළහැකි ය.

*17 වැනි වගන්තිය*

*කලා ශිල්පීන් සහ ක්‍රීඩකයන්*

1. 14 වැනි සහ 15 වැනි වගන්තිවල විධිවිධානයන් හි කුමක් සඳහන් වුව ද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විනෝදය සපයන්නෙකු වශයෙන් නාට්‍ය, චලන චිත්‍රපට, ගුවන් විදුලි හෝ රූපවාහිනී ශිල්පියෙකු වැනි කලා ශිල්පියෙකු ලෙස හෝ සංගීතඥයකු වශයෙන් හෝ ක්‍රීඩකයකු වශයෙන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී ස්වකීය එවැනි පුද්ගලික කටයුතුවල නිරත වීමෙන් ලබන ආදයම, එම අනෙක් රාජ්‍යයයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. විනෝදය සපයන්නෙකු හෝ ක්‍රීඩකයෙකු විසින් එබඳු ස්වකීය පුද්ගලික කටයුතුවල නිරතවීම සම්බන්ධයෙන් වන ආදායම, එම විනෝදය සපයන්නාටම හෝ ක්‍රීඩකයාටම නොව වෙනත් තැනැත්තෙකුට උපචිත වන අවස්ථාවකදී, 7 වැනි, 14 වැනි සහ 15 වැනි වගන්තිවල කුමක් සඳහන් වුව ද, එම ආදයම විනෝදය සපයන්නාගේ හෝ ක්‍රීඩකයාගේ කටයුතු ක්‍රියාත්මක වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

3. 1 වැනි සහ 2 වන ඡේදයෙහි විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ගිවිසුම්කාර රාජ්‍යයන් අතර පවතින සංස්කෘතික ගිවිසුමක් හෝ වැඩ වැඩපිළිවෙලක් යටතේ සිදුවන 1 වන ජේදයෙහි සඳහන් ක්‍රියාකාරකම්වලින් උද්ගත වන ආදායම එම සංචාරය සඳහා ආධාර, සම්පූර්ණයෙන් ම හෝ වැඩිවශයෙන් ගිවිසුම්කාර රාජ්‍යයන් අතුරින් එකක, එහි ප්‍රදේශීය බලමණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අරමුදල් මගින් ලබා දී ඇති විට, එම ක්‍රියාකාරකම් සිදු කරන ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් කළ යුතු ය.

*18 වැනි වගන්තිය*

*විශ්‍රාම වැටුප් සහ වාර්ෂික*

1. 19 වැනි වගන්තියේ 2 වැනි ඡේදයේ විධිවිධානයන් ට යටත් ව, ගිවිසුම්කාර රාජ්‍යයක දී උද්ගත වන සහ අතීත සේවා නියුක්තිය හෝ සේවාවන් සැලකිල්ලට ගෙන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන විශ්‍රාම වැටුපක් හෝ එවැනි වෙනත් පාරිශ්‍රමික, ඒවා උද්ගත වන පළමුව සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයේ දී උද්ගත වන සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන වාර්ෂික, ඒවා උද්ගත වන රාජ්‍යයේ දී බද්දට යටත් කරනු ලැබිය හැකි ය.

3. ''වාර්ෂික'' යන පදයෙන්, මුදලින් හෝ මුදලේ වටිනාකමෙන් ප්‍රමාණවත් හා සම්පූර්ණ ප්‍රතිෂ්ඨාවක් සඳහා ගෙවීම් කිරීමේ බැදියාවක් යටතේ, ආයු කාලය තුළ දී හෝ නිශ්චිතව සඳහන් කරන ලද හෝ නිශ්චය කළහැකි කාලපරිච්ඡේදයක් තුළ දී, ප්‍රකාශිත වේලාවන්හි දී, කාලීනව ගෙවිය යුතු වන ප්‍රකාශිත මුදල් අදහස් කෙරේ.

**19 වැනි වගන්තිය**

***ආණ්ඩුවේ සේවය***

1. (අ) ගිවිසුම්කාර රාජ්‍යයක ආණ්ඩුව, හෝ එහි දේශපාලන උප කොට්ඨාශයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක් විසින් එම රාජ්‍යය, උප කොට්ඨාශය හෝ බල මණ්ඩලය වෙත ඉටුකරන ලද සේවාවන් වෙනුවෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන, වැටුප්, වේතන සහ විශ්‍රාම වැටුප් හැර වෙනත් සමාන පාරිශ්‍රමික, එම රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

(ආ) කෙසේ වුවද, එම පුද්ගලයා එම සේවාවන් ඉටු කරන ලද්දේ අනෙක් රාජ්‍යයෙහි දී නම් සහ ඔහු එම අනෙක් රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එකී පුද්ගලයා:

(i) එම රාජ්‍යයේ ජාතිකයෙකු වේ නම්; හෝ

(ii) හුදෙක් එම සේවාවන් ඉටු කිරීමේ කාර්යය සඳහා ම පමණක් එම ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු බවට පත් නොවූවකු නම්;

එවැනි වැටුප්, වේතන හා වෙනත් සමාන පාරිශ්‍රමිකයන් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේහි දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

2 (අ) 1 වැනි ඡේදයේ විධිවිධානයන්හි කුමක් සඳහන් වුව ද, ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි දේශපාලන උප කොට්ඨාශයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක් විසින් හෝ ඒවායින් ඇති කරන ලද අරමුදල්වලින්, එම රාජ්‍යය, උප කොට්ඨාශය හෝ බල මණ්ඩලය වෙත ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන යම් විශ්‍රාම වැටුපක් සහ වෙනත් සමාන පාරිශ්‍රමික, එම ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

(ආ) කෙසේ වුව ද, එම පුද්ගලයා එකී අනෙක් රාජ්‍යයෙහි වාසිකයෙකු සහ ජාතිකයෙකු වන්නේ නම් එවැනි පුද්ගලයෙකු අනෙක් ගිවසුම්කාර රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

3. ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි දේශපාලන උප කොට්ඨාශයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක් විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඉටු කරන ලද සේවාවන් සම්බන්ධයෙන් වන වැටුප්, වේතන, විශ්‍රාම වැටුප් සහ වෙනත් සමාන පාරිශ්‍රමික සම්බන්ධයෙන් 14, 15, 16 සහ 18 යන වගන්තිවල විධිවිධාන අදළ විය යුතු ය.

**20 වැනි වගන්තිය**

***ගුරුවරුන් සහ පර්යේෂකයන්***

1. අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයට පැමිණීමට පූර්වාසන්නයෙහි ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වූ හෝ වාසිකව සිටින මහාචාර්යවරයෙකු, ගුරුවරයෙකු හෝ පර්යේෂකයෙකු ඉගැන්වීම හෝ පර්යේෂණ පැවැත්වීම හෝ එම කාර්යයන් දෙකම සඳහා එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ විශ්වවිද්‍යාලයකට, විද්‍යාලයකට, හෝ වෙනත් සමාන අනුමත ආයතනයකින් ලබන ඔහු/ඇය එකී රාජ්‍යයට ඔහුගේ එකී ඉගැන්වීම හෝ පර්යේෂණ සඳහා වන පාරිශ්‍රමික පැමිණෙන දින සිට වසර දෙකක් නොඉක්මවන කාලපරිච්ඡේදයක් සඳහා එකී අනෙක් රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් විය යුතුය.

2. නිශ්චිත තැනැත්තෙකුගේ හෝ තැනැත්තන්ගේ පෞද්ගලික ප්‍රතිලාභ සඳහා මූලිකව පර්යේෂණ කිරීම් භාර ගන්නේ නම්, එකී පර්යේෂණ පැවැත්වීම වෙනුවෙන් මහාචාර්යවරයෙකු හෝ ගුරුවරයෙකු ලබන පාරිශ්‍රමිකයකට මෙම වගන්තිය අදළ නොවිය යුතු ය.

21 වැනි වගන්තිය

*ශිෂ්‍යයන් සහ අභ්‍යාසලාභීන්*

1. ගිවිසුම්කාර රාජ්‍යයකට පැමිණීමට පූර්වාසන්නයෙහි අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුවන හෝ වාසිකයෙකු වූ හෝ හුදෙක් සිය අධ්‍යාපනය හෝ පුහුණුව සඳහා පළමුව සඳහන් රාජ්‍යයෙහි සිටින අධ්‍යයනයේ යෙදෙන්නෙකු, ශිෂ්‍යයෙකු, ආධුනිකයෙකු හෝ ව්‍යාපාර අභ්‍යාසලාභියෙකු ස්වකීය නඩත්තුව, අධ්‍යාපනය හෝ පුහුණුව සම්බන්ධ කාර්යයන් සඳහා ලබන ගෙවීම් එම රාජ්‍යයට පරිබාහිර ප්‍රභවයන්ගෙන් පැන නගින්නේ නම්, එම රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් විය යුතු ය.

22 වැනි වගන්තිය

*වෙනත් ආදායම්*

1. මෙම ගිවිසුමෙහි පූර්ව වගන්තිවල සඳහන් නොවන, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුගේ ආදායම් අයිතමයන් උද්ගත වීම කොතනක සිදු වුවත් එම රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතු ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී රාජ්‍යයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි නම් හෝ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථාවර පදනමක් මගින් එම අනෙක් රාජ්‍යයේ ස්වාධීන පුද්ගලික සේවාවන් ඉටු කරයි නම් සහ ආදායම ගෙවනු ලබන අයිතිවාසිකම් හෝ දේපල ඉහත සඳහන් ස්ථිර ආයතනයට හෝ ස්ථාවර පදනමට එළඳයී ලෙස සම්බන්ධ වී ඇත්නම්, 6 වන වගන්තියේ 2 වැනි ඡේදයේ අර්ථ දක්වා ඇති පරිදි නිශ්චල දේපල වලින් ලැබෙන ආදායම හැර, අනෙකුත් ආදායම්වලට මෙම වගන්තියේ I වන ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. එබඳු අවස්ථාවලදී 7 වැනි වගන්තියේ හෝ 14 වන වගන්තියේ විධිවිධාන අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුත්තේ ය.

3. 1 සහ 2 වන ඡේදවල කුමක් සඳහන් වුව ද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුගේ මෙම ගිවිසුමේ පූර්ව වගන්ති යටතේ කටයුතු කළ නොහැකි සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී උද්ගතවන්නාවූ ආදායම් එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කරනු ලැබිය හැකි ය.

23 වැනි වගන්තිය

*ද්විත්ව බදුකරණය ඉවත් කිරීම*

1. මෙම ගිවිසුමේ විධිවිධානයන්ට අනුකූලව, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් උපයනු ලබන ආදායම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කරනු ලැබිය හැකි අවස්ථාවක දී, ප්‍රථමයෙන් සඳහන් කරන ලද ගිවිසුම්කාර රාජ්‍යය එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී ගෙවන ලද ආදායම් බද්දට සමාන මුදලක් එම වාසිකයාගේ ආදායම මත බද්දෙන් අඩු කිරීමක් ලෙස ඉඩදිය යුතු ය. කෙසේ වුව ද, එම අඩු කිරීම, ලබාදීමට පෙර ගණනය කරන ලද එකී අනෙක් රාජ්‍යයේදී උද්ගතවන ආදායමට ආරෝපණය කළ හැකි බද්දේ කොටස නොඉක්මවිය යුතු ය.

2. මෙම ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් උපයනු ලබන ආදායම එකී ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් වන විට, එසේවුවද වුවත්, එම ගිවිසුම්කාර රාජ්‍ය විසින් එම වාසිකයාගේ ඉතිරි ආදායම මත බද්ද ගණනය කිරීමේ දී එසේ නිදහස් කරනු ලැබූ ආදායම සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

3. මෙම වගන්තියේ කාර්යය සඳහා ''බද්ද'' යන පදයෙන් පද සම්බන්ධය අනුව අවශ්‍ය පරිදි ශ්‍රී ලංකා බද්ද හෝ පෝලන්ත බද්ද අදහස් වන නමුත් මෙම ගිවිසුම අදාළ වන්නාවූ බදුවලට අදාළ යම් පැහැර හැරීමක් හෝ අත්හැරීමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු කිසියම් මුදලක්, හෝ මෙම ගිවිසුමේ අදාළ වන බදු සම්බන්ධයෙන් පනවන ලද යම් දණ්ඩනයක් හෝ දඩ මුදලක් නියෝජනය කරන්නා වූ කිසියම් මුදලක් මෙයට ඇතුළත් නොවේ.

24 වැනි වගන්තිය

*වෙනස් ලෙස නොසැලකීම*

1. එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී, එම රාජ්‍යයේ වාසිකභාවය සම්බන්ධයෙන් විශේෂිතව, ඒ හා සමාන තත්ත්වයේ සිටින එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයන්ට වඩා වෙනස් වූ හෝ දැරීමට වඩාත් දුෂ්කර වූ යම් බදු අයකිරීමට හෝ ඒ හා සම්බන්ධ අවශ්‍යතාවයකට යටත් කරනු නොලැබිය යුතුය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායයකට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ඇති ස්ථිර ආයතනයක් සම්බන්ධයෙන් බදුකරණය, එම කටයුතුවලම නියැලෙන එම අනෙක් රාජ්‍යයේ ව්‍යවසායයන් සම්බන්ධයෙන් අදාළ වන බදුකරණයට වඩා අඩු වාසි සැලසෙන පරිදි එකී අනෙක් රාජ්‍යයේ දී සිදු නොකළ යුතු ය. ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් සිය වාසිකයන්ට සිවිල් තත්ත්වය හෝ පවුලේ වගකීම් හේතුකොටගෙන බදු කාර්යය සඳහා දෙනු ලබන පෞද්ගලික දීමනා, සහන සහ අඩුකිරීම්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයන්ට ලබාදීමට මෙම විධිවිධානය මගින් බැඳෙනු ඇතැයි තේරුම් නොගත යුතු ය.

3. 9 වන වගන්තියේ I වන ඡේදයේ, II වන වගන්තියේ 8 වන ඡේදය හෝ 12 වන වගන්තියේ 6 වන ඡේදයේ විධිවිධාන බල පවත්නා අවස්ථාවලදී හැර, ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන පොලී, රාජ්‍යභාග, තාක්ෂණික සේවා සඳහා ගාස්තු සහ අනෙකුත් වියදම් එවැනි ව්‍යවසායක බද්දට යටත් ලාභ නිර්ණය කිරීමේ කාර්යය සඳහා පළමුව සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලැබූ විට අඩුකරන ආකාරයටම එම කොන්දේසි යටතේම අඩුකළ යුතු ය.

4. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යාවසායන්හි ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු හෝ වාසිකයන් වැඩි දෙනෙකු විසින් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් අයත් කර ගෙන සිටින කල්හි හෝ පාලනය කරනු ලබන කල්හි, එකී පළමුව සඳහන් රාජ්‍යයේ එබඳු වෙනත් ව්‍යවසායයන් යටත්වන හෝ යටත් කළ හැකිවන බදුවලට හෝ ඒ හා සම්බන්ධ වෙනත් අවශ්‍යතාවයන්ට වඩා වෙනස් වූ හෝ ඉසිලීමට වඩා දුෂ්කර වූ කිසිදු බද්දකට හෝ ඒ හා සම්බන්ධ වෙනත් අවශ්‍යතාවයන්ට එකී පළමුව සඳහන් රාජ්‍යයෙහි දී යටත් කරනු නොලැබිය යුතු ය.

**25 වැනි වගන්තිය**

*අන්‍යෝන්‍ය එකඟත්ව ක්‍රියා පිළිවෙල*

1. ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙන් එකක හෝ දෙකෙහිම ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ගිවිසුමෙහි විධිවිධානයන්ට අනුකූල නොවන අයුරින් තමා බදුකරණයට පාත්‍ර වී ඇතැයි හෝ පාත්‍ර වන්නේ යැයි යම් ගිවිසුම්කාර රාජ්‍යයක තැනැත්තෙකු සලකන අවස්ථාවක, එකී රාජ්‍යයන්හි අභ්‍යන්තර නීති මගින් ප්‍රතිකර්මයන් සලසා තිබුනේ වුව ද, ඔහු වාසිකයකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා වෙත, හෝ ඔහුගේ සිද්ධිය 24 වැනි වගන්තියේ 1 වැනි ඡේදය යටතට ගැනේ නම්, ඔහු ජාතිකයෙකු වන රාජ්‍යයේ නිසි බලධරයා වෙත, කරුණු ඉදිරිපත් කිරීමට ඔහුට හැකි ය. මෙම ගිවිසුමෙහි විධිවිධානවලට අනුකූල නොවන බදුකරණයට අදළ ක්‍රියාව පිළිබඳ ප්‍රථම දැන්වීමෙන් පසුව වර්ෂ තුනක් ඇතුළත එකී කරුණු ඉදිරිපත් කිරිම කළ යුතු ය.

2. විරෝධතාවය යුක්ති සහගත යයි නිසි බලධරයාට පෙනී යන්නේ නම් සහ තනිව යෝග්‍ය විසඳුමක් කරා එළඹීමට ඔහු අපොහොසත් වන්නේ නම් මෙම ගිවිසුමට අනුකූල නොවන බදුකරණය වළක්වාලීමේ අදහසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා සමග අන්‍යෝන්‍ය එකඟත්වයෙන් තත්තවය නිරාකරණය කර ගැනීමට ඔහු උත්සාහ කළ යුතු ය. එළඹෙන ලද යම් එකඟතාවයක් ගිවිසුම්කාර රාජ්‍යයන්හි දේශීය නීතීන් යටතේ පවතින කාලය පිළිබඳ යම් සීමා කිරිම් වලට යටත් නොකර ක්‍රියාත්මක කළ යුතු ය.

3. මෙම ගිවිසුම අර්ථනිරූපණය කිරිම හෝ අදළ කිරීම සම්බන්ධයෙන් යම් දුෂ්කරතාවයක් හෝ සැකයක් පවතී නම් ඒවා ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන්ගේ අන්‍යෝන්‍ය එකඟත්වයෙන් නිරාකරණය කර ගැනීමට උත්සාහ කළ යුතු ය. මෙම ගිවිසුමෙහි විධිවිධාන සලසා නොමැති අවස්ථාවන්හි දී ද්විත්ව බදුකරණය ඉවත් කිරීම සඳහා ඔවුන් සාමූහිකව සාකච්ඡා කළ යුතු ය.

4. පූර්ව ඡේදවල අර්ථානුකූලව එකඟතාවයකට එළඹීමේ කාර්යය සඳහා ගිවිසුම්කාර රාජ්‍යවල නිසි බලධාරීන්ට කෙළින්ම එකිනෙකා අතර අදහස් හුවමාරු කරගත හැකි ය. මෙම වගන්තියෙන් විධිවිධාන සලසා ඇති අන්‍යෝන්‍ය එකඟත්ව ක්‍රියා පිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා නිසි බලධරයන් විසින් උපදේශනයන් තුළින් උචිත ද්විපාර්ශ්වික ක්‍රියාපිළිවෙල, කොන්දේසි, විධි සහ ශිල්පක්‍රම සකස් කර ගනු ලැබිය හැකිය.

**26 වැනි වගන්තිය**

*තොරතුරු හුවමාරු කර ගැනීම*

1. බදුකරණය මෙම ගිවිසුමට ප්‍රතිවිරුද්ධ නොවනතාක් දුරට, මෙම ගිවිසුමෙහි විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමෙහිලා හෝ ගිවිසුම්කාර රාජ්‍යයන් හෝ එහි දේශපාලන උප කොට්ඨාශයන් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයන් වෙනුවෙන් පනවන ලද ඕනෑම විස්තරයකට අයත් බදු සම්බන්ධයෙන් වන දේශීය නීතීන් පරිපාලනය හෝ බලාත්මක කිරීම සඳහා හෝ අදළ වන්නේ යැයි පූර්ව නිගමනයකට එළඹිය හැකි තොරතුරු ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධරයන් විසින් හුවමාරු කර ගත යුතු ය. එලෙස තොරතුරු හුවමාරු කර ගැනීම 1 වැනි හා 2 වැනි වගන්තිවලින් සීමා නොකෙරේ.

2. 1 වැනි ඡේදය යටතේ ගිවිසුම්කාර රාජ්‍යයකට ලැබෙන යම් තොරතුරක්, එම රාජ්‍යයේ දේශීය නීති යටතේ ලබාගත් තොරතුරු සම්බන්ධයෙන් සලකන පරිද්දෙන්ම රහස්‍ය සේ සැලකිය යුතු අතර, 1 වන ඡේදයෙහි සඳහන් බදුවලට අදාල තක්සේරු කිරීම හෝ අය කිරීම, ඒ සම්බන්ධයෙන් බලාත්මක කිරීම හෝ නඩු පැවරීම, හෝ එම බදු සම්බන්ධ අභියාචනා තීරණය කිරීම හෝ ඒවාට අදළ යම් මගහැරුණු කාරණයකට හා සම්බන්ධ වූ තැනැත්තන්ට හෝ බලධරයන්ට (උසාවි හා පරිපාලන මණ්ඩල ද ඇතුළුව) පමණක් හෙළි කළ යුතු ය. එවැනි තැනැත්තන් හෝ බලධරයන් එවැනි කටයුතු සඳහා පමණක් මෙම තොරතුරු භාවිතා කළ යුතු ය. ඔවුනට ප්‍රසිද්ධ උසාවි කටයුතුවලදී හෝ අධිකරණ ක්‍රියාදාමයන්හි දී එම තොරතුරු හෙළි කළ හැකිය.

3. 1 වැනි සහ 2 වැනි ඡේදයන්හි විධිවිධාන මගින් ගිවිසුම්කාර රාජ්‍යයක් මත, පහත සඳහන් බැඳීම් පැනවෙන්නේ යයි කිසිදු අවස්ථාවක දී තේරුම් නොගත යුතු යඃ

(අ) එම ගිවිසුම්කාර රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති හෝ පරිපාලනමය භාවිතයන්වලින් වෙනස් ආකාරයට පරිපාලනමය විධිවිධාන ක්‍රියාත්මක කිරීම;

(ආ) එම ගිවිසුම්කාර රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ හෝ සාමාන්‍ය පරිපාලන ක්‍රියාවලියේ දී ලබාගත නොහැකි තොරතුරු සැපයීම;

(ඇ) යම් වෙළඳ, ව්‍යාපාරික, කාර්මික, වාණිජ්‍ය හෝ වෘත්තීය රහසක් හෝ වෙළෙඳ ක්‍රියාවලියක් හෙළිදරව් විය හැකි තොරතුරක් සැපයීම, හෝ හෙළිකිරීම රජයේ ප්‍රතිපත්තියට (Order Public) පටහැනි වන යම් තොරතුරක් සැපයීම.

4. මෙම වගන්තියට අනුකූලව යම් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් තොරතුරු අපේක්ෂා කරන්නේ නම්, අනෙක් රාජ්‍යය විසින් ස්වකීය බදු පරමාර්ථයන් සඳහා එවැනි තොරතුරු අවශ්‍ය නොවන්නේ වුව ද, ඉල්ලා සිටින ලද තොරතුරු ලබා ගැනීම පිණිස එකී තොරතුරු රැස්කිරීම ක්‍රියා මාර්ග භාවිතා කළ යුතු ය. මෙකී බැඳීම 3 වන ඡේදයේ සඳහන් සීමාවන්ට යටත් වන නමුත්, කිසිදු අවස්ථාකදී එකී සීමාවන් මගින් ගිවිසුම්කාර රාජ්‍යයක් හුදෙක් එවැනි තොරතුරු සම්බන්ධයෙන් දේශීය වශයෙන් උනන්දුවක් නැති නිසාම එම තොරතුරු සපයා දීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩ දීමක් ලෙස තේරුම් නොගත යුතු ය.

5. තොරතුරු, හුදෙක් බැංකුවක් භාරයේ පැවතීම, වෙනත් මූල්‍ය ආයතනයක් භාරයේ පැවතීම, නාමිකයෙකු හෝ නියෝජිතයෙකු ලෙස ක්‍රියා කරන තැනැත්තෙකු හෝ පීත කොමිස් භාරකරුවෙකු වශයෙන් භාරයේ තබා ගැනීම හේතුවෙන් ම හෝ එය තැනැත්තෙකුගේ අයිතිය පිළිබඳ හිමිකම්වලට සම්බන්ධවූවක් නිසා එම තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩ දීමක් ලෙස 3 වන ඡේදයේ සඳහන් විධිවිධාන වටහා නොගත යුතු ය.

## 27 වැනි වගන්තිය

### *ප්‍රතිලාභ සීමා කිරීම*

එළඹෙන වැඩපිළිවෙල වල ප්‍රධාන අරමුණ හෝ ඉන් එකක් වන්නේ අන් ආකාරයකින් ලබාගත නොහැක්කා වූ යම් ප්‍රතිලාභ ලබා ගැනීමට යයි සැලකෙන අවස්ථාවකදී මෙම ගිවිසුම මගින් විධිවිධාන සලසා ඇති ප්‍රතිලාභ ලබාගත නොහැකිය.

## 28 වැනි වගන්තිය

### *රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සාමාජිකයින් සහ කොන්සල් තනතුරු*

ජාත්‍යන්තර නීතියේ පොදු නීති රීති යටතේ හෝ විශේෂ ගිවිසුම්වල විධිවිධාන යටතේ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සාමාජිකයින්ගේ හෝ කොන්සල් තනතුරුවලට හිමි මූල්‍ය වරප්‍රසාද කෙරෙහි මෙම ගිවිසුමේ කිසිවක් බලනොපෑ යුතු ය.

## 29 වැනි වගන්තිය

### *බලාත්මක වීම ආරම්භ වීම*

1. මෙම ගිවිසුම බලාත්මක කිරීම සඳහා ස්වකීය නීතිය මගින් අවශ්‍ය කෙරෙන කාර්යය පටිපාටි සම්පූර්ණ කර ඇති බව එක් එක් ගිවිසුම්කාර රාජ්‍ය විසින් රාජ්‍ය තාන්ත්‍රික මාර්ගයන් හරහා අනෙක් රාජ්‍යයට දන්වා සිටිය යුතු ය.

2. මෙම දැනුම් දීම් අතුරින් පසුව කෙරෙන දැනුම් දීමේ දිනෙන් ගිවිසුමේ මාස තුනක කාලපරිච්ඡේදයකට පසුව බලාත්මක වන අතර, ඒ අනුව

(අ) ප්‍රභවයේ දී රඳවාගත් බදු සම්බන්ධයෙන්, ගිවිසුම බලාත්මක වීම ආරම්භ වන වර්ෂයට ඉක්බිතිවම එළඹෙන පළමුවැනි ලිත් වර්ෂයේ ජනවාරි මස 1 වැනි දින හෝ ඉන්පසුව ලබන ආදායම මත; සහ

(ආ) අනෙකුත් බදු සම්බන්ධයෙන්, ගිවිසුම බලාත්මක වීම ආරම්භවන වර්ෂයට ඉක්බිතිවම එළැඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස 1 වැනි දින හෝ ඉන්පසුව ආරම්භවන යම් බදු අයකළ හැකි වර්ෂයක් සඳහා ලබන ආදායම මත;

ගිවිසුම් ක්‍රියාත්මක විය යුතු ය.

3. මෙම වගන්තියේ විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, කාරණය අදළ වන බදු අයකළ හැකි කාලපරිච්ඡේදය පිළිබඳව නොසලකා, 25 සහ 26 වැනි වගන්තිය වල අන්තර්ගත විධිවිධාන (අන්‍යොන්‍ය එකඟත්ව ක්‍රියා පිළිවෙල සහ තොරතුරු හුවමාරු කර ගැනීම) මෙම ගිවිසුම බලාත්මක වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

4. පෝලන්ත ජනරජ ආණ්ඩුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර, ආදායම් හා ප්‍රාග්ධන මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මග හැරීම වැළැක්වීම සඳහා වූ 1980 අප්‍රේල් 25 දින අත්සන් කරන ලද සම්මුතිය, මෙම වගන්තියේ 1, 2 සහ 3 වැනි ඡේදයන්හි විධිවිධානවලට අනුකූලව මෙම ගිවිසුම අදළ වන බදු සම්බන්ධයෙන්, මෙම ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට අවසන් විය යුතු අතර ක්‍රියාත්මක වීම නැවතිය යුතු ය.

**30 වැනි වගන්තිය**

***අවසන් කිරීම***

1. යම් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් අවසන් කරනු ලබන තෙක් මෙම ගිවිසුම බල පැවැත්විය යුතු වේ. ගිවිසුම බලාත්මකවන දිනයේ සිට වසර පහක කාල පරිච්ඡේදයකින් පසුව එළැඹෙන ඕනෑම ලිත් වර්ෂයක් අවසන්වීමට අඩු වශයෙන් මාස හයකට පෙර රාජ්‍ය තාන්ත්‍රික මාර්ග හරහා අවසන් කිරීම පිළිබඳ නිවේදනයක් මගින් කවර හෝ ගිවිසුම්කාර රාජ්‍යයකට මෙම ගිවිසුම අවසන් කළ හැකි ය.

2. එවැනි අවස්ථාවක දී;

(අ) ප්‍රභවයේදී රඳවාගත් බදු සම්බන්ධයෙන් වන විට නිවේදනය ලබා දුන් ලිත් වර්ෂයට ඉක්බිතිව එළැඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස පළමුවන දින හෝ ඉන් පසුව කරන ලද ගෙවීම් හෝ බැර කිරීම් මත;

(ආ) ආදායම් මත බදු සම්බන්ධයෙන් වන විට නිවේදනය ලබාදෙන ලද ලිත් වර්ෂයට ඉක්බිතිවම එළැඹෙන ලිත් වර්ෂයේ ජනවාරි මස පළමු වැනි දින හෝ ඉන්පසුව ආරම්භවන යම් බදු අයකළ හැකි වර්ෂයක් සඳහා වන ආදායම් මත

මෙම ගිවිසුම ක්‍රියාත්මක වීම අවසන් වන්නේ ය.

මීට සාක්ෂි වශයෙන් විධිමත් පරිදි බලය ලැබූ මෙහි පහත අත්සන් කරන ලද අය මෙම ගිවිසුමට අත්සන් තබන ලදී.

එක හා සමාන බල සහිත සියලුම පාඨයන්ගෙන් යුක්ත සිංහල, පෝලන්ත සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් මුල් පිටපත් දෙකකින් යුතු ව 2015, ඔක්තෝබර් මස 6 වැනි දින කොළඹ දී අත්සන් තබන ලදී. අර්ථ නිරූපණයේ දී ප්‍රතිවිරුද්ධතාවක් ඇති වුවහොත් ඉංග්‍රීසි පාඨය බල පැවැත්විය යුතු ය.

ගරු හර්ෂ ද සිල්වා,
විදේශ කටයුතු අමාත්‍ය - ආවරණ,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ආණ්ඩුව වෙනුවෙන්.

ගරු ලේස්ක් සොක්ස්විකා,
විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය,
පෝලන්ත ජනරජයේ
ආණ්ඩුව වෙනුවෙන් .

07-798

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.